### මව්පියෝ

උසට උසේ වැඩුණත් බැහැ මැනගන්න
උසට උසේ වැඩුණත් බැහැ පලගන්න
සත්ථා බුදුගුණෙන් බැහැ ඇය පරදන්න
එපා පුතේ මව්පියො හට දුක් දෙන්න

ධර්මය අනුව ලංකාවත් බැබළෙන වා
මනුස්සකම් අද නැතිවෙන්නට යන වා
මිනිසුන් අනුව මව්පියො අද බැබළෙනවා
මෙවන් මව්පියෝ ලෝකෙම වැජඹෙනවා

♦ **ධම්මික බණ්ඩාර හේරත්**
තලාව මහ විදුහල
අනුරාධපුරය Sri Lanka

### සොබාදහම


ඇළ දොළ දිය ඇලි ගංගා
වන අසිරිය තව නංගා
ගල් අතරින් පැන නැංගා
සුදු පෙණ පිඩු ටික නංගා

කිචි බිචි හඬ රැව් දෙන්නේ
ගස්වල දළු සෙළ වෙන්නේ
මී අඹ ගෙඩි රස ගන්නේ
සොබා සිරිය දිස් වන්නේ

රථවාහන දිව යන්නේ
කම්හල් වැඩ අර ඔන්නේ
කළු දුම්ගුලි නං වන්නේ
පරිසරයයි වන සන්නේ

ගහ කොල මල් සුරකිමු
ඇළ දොළ ගං සුරකිමු
පරිසරයත් සුරකිමු
දෑස වගේ රැකගමු

♦ **අවිශ්නා හිමල්ෂි වීරකෝන්**
විද්‍යාලෝක මහ විදුහල
පත්තලගෙදර Sri Lanka




**Children's Corner**

## World's first free lending library
## ලොව ප්‍රථම නිදහස් පුස්තකාලය

6 Sep 1852, The world's first free lending library opened in Manchester in the UK. The first public library was set up in Canterbury, Kent, five years earlier but charged a penny for admission and a penny for book loan. More than 20,000 factory workers contributed funds to set up the Manchester Free Library. In its first year, 77,232 books were borrowed - but it was not until Clerkenwell Library opened in East London 40 years later that readers could browse. Previously they had to consult a catalogue and ask for a book to be retrieved.

**1852** සැප්තැම්බර් මස **6** වෙනි දින ලොව ප්‍රථම නොමිලේ පොත් දෙන පුස්තකාලය එක්සත් රාජධානියේ මැන්චෙස්ටර් නගරයේ විවෘත විය. ඊට වසර 6 කට පෙර කෙන්ට් ප්‍රාන්තයේ කැන්ටබරි නගරයේ මුල්ම මහජන පුස්තකාලය විවෘත වූ නමුත් එහි ඇතුල්වීමේ ගාස්තුව පැන්සයක් ද, එක් පොතක් ලබාගන්නට පැන්සයක් ද අය කෙරිණ. මැන්චෙස්ටර් පුස්තකාලය පිහිටුවීම පිණිස කර්මාන්ත ශාලා සේවකයෝ 20,000කට වඩා මුදල් පරිත්‍යාග කළහ. මුල් අවුරුද්දේම පොත් 77232 ක් පිටතට ගෙන යන ලදී. එහෙත් නැගෙණහිර ලන්ඩනයේ ක්ලාකන්වෙල්හි පුස්තකාලයක් විවෘත වූ පසුවය ජනතාවට පොත් පෙරලා බලන්නට අවස්ථාවක් ලැබුණේ. ඊට පෙර පුස්තකාලයේ ඇති පොත් සඳහන් කැටලොග් පොතක් පෙරලා අවශ්‍ය පොත් ඇණවුම් කළ යුතු විය.

♦ *Auntie Ramani ( රමණී නැන්දා)*

කබරගොයෙක් වෙළ මැද්දේ කක්කුට්ටන් ගිලිනවා
ඒක දැකපු හා පැටියෙක් කැලේ කඩන් දුවනවා
කොක්හාමී වක්කලමේ මාළු පැඅටව් ගණිනවා
බටිති පැටව් අතු අග ඉඳ කුරුළුගීත ගයනවා

රන්වන් වුණු ගොයම් කරල් තාලෙට හිඳ රහනවා
කුඹුක් ගසේ බෙනයට වී ගිරා පැටව් අඬනවා
මාල ගිරා රැන් පිටින් කුඹුරෙ ගොයම් කපනවා
තනි කකුලේ පඹ රාළත් ගොයමට තනි රකිනවා

### වෙල්යායේ අසිරිය !

ඇළ නියරේ හිඳ එළදෙන පැටියට අඬ ගහනවා
නිල්ල පිරුණු වෙල්යායට උගේ හිත ඇදෙනවා
වෙල මැද්දේ පඹයා දැක පැටියට බය හිතෙනවා
නියර දිගේ පෙරළි පෙරළි අම්ම ළඟට දුවනවා

♦ **දිලීප දනුෂ්ක**
හමංගල්ල ම. වි. නාරංගොඩ Sri Lanka


# ලංකා බැංකුව
# BANK OF CEYLON

ඔබට විශ්වාස තැබිය හැකි බැංකුවයි

## ලන්ඩන් ශාඛාව

**ඔබේ මුදල් ගාස්තුවකින් තොරව සුරක්ෂිතව හා විශ්වාසදායකව ශ්‍රීලංකාවට ප්‍රේෂණයකිරිමේ මහඟු අවස්ථාවක් !**

* ලංකා බැංකුවේ ලන්ඩන් ශාඛාව මගින් ශ්‍රීලංකාවේ ලංකා බැංකු ශාඛාවන්හි පවත්වාගෙන යනු ලබන ඕනෑම ගිණුමකට ඔබත් ගාස්තුවකින් තොරව මුදල් ප්‍රේෂණය කරන්න.

* ඔබගේ ඉතුරුම් වෙනුවෙන් ලංකා බැංකුවේ අනේවාසික විදේශ ගිණුමක් (NRFC) ආරම්භකර පවුම් වලින් මුදල් ප්‍රේෂණය කර පහත සඳහන් ප්‍රතිලාභ ලබාගන්න.

1. පවුම් වලින්ම පොළිය ලබාගැනීම.
2. ගිණුමේ ඇති මුදල් නිදහසේ ඕනෑම අයෙකුට හෝ විදේශ රටක ඇති ගිණුමකට ප්‍රේෂණය කිරීමේ හැකියාව.
3. NRFC ගිණුම මාර්ගයෙන් මුදල් ප්‍රේෂණය කිරීමෙන් උපරිම විනිමය අනුපාතිකයක් රුපියල් සඳහා ලබාගැනීමේ හැකියාව.

*ලංකා බැංකුවට පැමිණීමෙන් හෝ* **HSBC, NATWEST, BARCLAYS** *බැංකු වලින් අපගේ පහත සඳහන් රැස්කිරීමේ ගිණුම්වලට මුදල් බැර කිරීමෙන් අනතුරුව අපව අමතන්න.*


**HSBC - Sort Code : 40 - 05 - 15 A/C - 00491624**
**NatWest - Sort Code : 60 - 00 - 04 A/C - 04607732**
**BARCLAYS - Sort Code : 20 - 32 - 53 A/C - 80113859**

**No 1, Devonshire Square, London EC2M 4WD**
**Phone : 020 7377 1888 Fax: 020 7377 5430**
**e-mail : bankofceylon.uk@btclick.com**
**Our Web - www.boc.lk**
**Nearest railway station - Liverpool Street (tube & rail) Bishop Gate Exit**


# හෙළ ජාතික අභිමානේ...!



**මා කැමති**
**ඔබ කැමති**
**✻ ගීයක්**



Karunaratne Abeysekera



C. T. Fernando

අසහාය ගායක සී. ටී. ප්‍රනාන්දු මහතා විසින් ගායනා කරන ලද, කීර්තිමත් ගීත රචක කරුණාරත්න අබේසේකර මහතා විසින් රචනා කරන ලද **හෙළ ජාතික අභිමානේ** නම් මේ ගීතයට මා වඩාත් කැමති හේතු කීපයකි.

මෙය අපේ ජාතික ගීයට හා සමානව ශ්‍රීලංකාවේ පමණක් නොව දේශ දේශාන්තරවල වෙසෙන සිංහළ දේශප්‍රේමීන් ලක්ෂ සංඛ්‍යාත වාරයක් ගායනා කර ඇති, එමෙන්ම ඔවුන් ඉතා භක්තියෙන් යුතුව අගයන ගීයකි. එසේම මෙය අප කාගෙත් කටට හුරු පදමාලාවකි. පිටරට වෙසෙන බොහෝ සිංහළ උදවියට නිතැතින්ම සිහියට, කටට එන ගීයකි මෙය. මේ ගීය ඇසෙන කල අප සිතට ගතට ප්‍රාණයක් ශක්තියක් දැනේ. මෙහි ඇති වටිනාකම එයයි. මේ මෑතක නාවුක හමුදා තූර්යවාදක කණ්ඩායම මෙම ගීතය වාදනය කරනු මම ඇසුවෙමි. ඒ මොහොතේ මට අපේ රට ගැන, රණවිරුවන් ගැන, අපේ අතීත වීරෝදාර මුතුන්මිත්තන් ගැන දැනුණේ වචනයෙන් කිව නොහැකි සතුටකි, ආඩම්බරයකි. මේ ගීය ගැයෙන බොහෝ තන්හි ශ්‍රාවක පිරිස් නැගී සිටිනු අප දැක ඇත. ඒ මේ ගීයෙන් කියැවෙන අදහස ඔවුන්ගේ සිතට එකහෙළා දැනීමත්, මේ ගීයට ඔවුන් තුළ ඇති ගෞරවය විදහා දැක්වීමත් සඳහා ය.

අපේ රටට වින කළ හතුරන් පරදවා අප රට ලැබූ ජය, ශක්තිය, සතුට තහවුරු කරගන්නට මෙවන් ගී අද අප සමාජයට අවශ්‍යය. විශේෂයෙන් නිදා වැටෙන අප සිංහළ සමාජයට මේ ගීයෙන් විසල් පනිවුඩයක් දෙයි. මෙය අපේ අභිමානයද සංකේතවත් කරන්නකි.

හෙළ ජාතික අභිමානේ
වැඩු විරුවන්සේ පොරණේ
දිනූ මව්බිම සව්සිරියෙන් සරසව්
පිබිදෙව්... පිබිදෙව්... සැරසෙව්...!
ආදි විකුම් පෑ හෙළ දරුවෝ
දෙස රැස මුර කෙරුවෝ
ඒ ලෙය ඇති ඔබ සුරුවිරුවෝ
නොමවව් ණයකරුවෝ
දැය දියුණට පැද යන නැවියා
ගොවියා බිම දෙවියා
සැපතෙහි විපතෙහි
නොසැලෙයි නොතැවෙයි
අට ලෝ දම හුරු හෙළයා

මුහුදට ඇදෙන මහ ගංගා
කුඹුරට යළි හරවා
ධාන්‍ය වගාකොට සිරිලක මේ
පෙරදිග කෙත කරවා
අරපිරිමැස්මට පුරුදු වෙලා
බිඳලව් දුක සංකා
පැරකුම් යුගයක් නැවතත් අරඹව්
නිජභූමි තලේ ලංකා....!

අතීතයේ සිට අද දක්වාම ශ්‍රීලංකාව කෘෂිකාර්මික රටකි. අපේ රට අතීතයේ වූ ශ්‍රී විභූතිය කරා යළිත් ගෙන ආ හැක්කේ ප්‍රධාන වශයෙන් ඒ අපට ආවේණික අංශය තුළිනි. අතීත මුතුන් මිත්තෝ කම්මැලි නැති කඩිසර පිරිසක් වූහ. කෙත්වතු අස්වැද්දූහ. ඔව්හු කාටවත් ණය නැති, නිදහස්, ස්වාධීනව සිතන ජනතාවක්ව සිටියහ. දුක සැප සමව විඳ දරාගන්නට ඔවුන්ට හැකියාව ලැබුණේ බුදු දහම තුළිනි. අටලෝ දහම හෙවත් අෂ්ඨ ලෝක ධර්මතාවන් ගැන වූ අවබෝධය නිසා ඔවුන් විපතේදී හෝ සැපතේදී සැලුණේ කලබල වුණේ නැත.

සිංහළයාට ඔහුගේ සංස්කෘතිය විසින් හිමිකර දී ඇති විඳ දරා ගැනීමේ ශක්තිය නිසාම අතීතයේ සිටම නානා සතුරු කරදර ආවත් මොහොතකට පසුබෑවේ වුවද යළි නැගී සිටීමට ද, ඒවාට සාර්ථකව මුහුණ පා ජය ලබන්නට ද හැකිවී ඇත. ඒ ආනුභාවය, ධෛර්‍යය අතීත විරුවන් විසින් අප හිතට කවනු ලැබ ඇත. දේශාභිමාන ගීතයකට අප නොලිහෙන සේ එක පොකුරක්ව බැඳ තබන්නට ද හැකිවී තිබේ.

අද යුගයේ අවශ්‍යතාවන් මතුකරලන එමෙන්ම අප ජනතාවට මග පෙන්වන ගීතයක් ලෙසද මෙය අගය කළ යුතුය. මෙවැනි ආදර්ශමත් ගීත තව තවත් අපට අසන්නට ලැබේවා!

♦ **කේ. ආර්. එන්. ඩී. ජයතිලක**
**ඉහළ කොත්මලේ** Sri Lanka

## අවමංගල්‍ය OBITUARY

### සීමන් ද සොයිසා මහතා (සිදත්)
### Mr Seemon de Zoysa (Sidatha)



**Formerly Sri Lanka Air Force mechanical engineer, and beloved husband of Gunawathie, loving father of Leonard, (late Lal), Mayuri, Senaka and Renuka, passed away of sudden unexpected circumstance. The funeral arrangements will be notified later.**

**79A, Hassop Road, Crickelwood, London NW2 6RX**
**Senaka 07826186355, 07861702669**